**මාධ්‍ය නිවේදනය**
කොළඹ, 2017 ජුලි 26

Nestlé
Good Food, Good Life

# ශ්‍රී ලංකාවේ ප්‍රථම Master Brand සම්මාන උළෙලේදී Global Master Brand කිරුළ මයිලෝ දිනාගනී

ශ්‍රී ලංකාවෙහි Global Master Brand යන නව සම්මානයට හිමිකම් කීමත් සමග මේ වර්ෂය, මයිලෝ වෙත සුවිශේෂී ඇගැයීම් රැසක් ලැබුණු වර්ෂයක් බවට පත්ව තිබේ. උසස් ගුණාත්මක නිෂ්පාදන පිරිනැමීමට මෙන්ම මෙරට ලොකු කුඩා සැම පාසලකම ක්‍රීඩා තුළින් පාරිභෝගිකයන්ගේ ජීවිත ස්පර්ශ කිරීමට, මයිලෝ සිදුකරන අඛණ්ඩ කාර්යභාරය නිසා පසුගියදා පැවැති ලංකාවෙහි පළමු Master Brand සම්මාන උළෙලේදී මෙම Global Master Brand සම්මානය දිනාගැනීමට මයිලෝ සමත්විය.

මෙම ගෝලීය සම්මානය, ලෝක අලෙවි කොංග්‍රසය (World Marketing Congress) විසින් ශ්‍රී ලංකාවට හඳුන්වාදෙනු ලැබූ අතර ප්‍රධාන අලෙවි නිලධාරී (CMO) කවුන්සිලය විසින් අනුමත කර ඇත. මෙම සම්මානය තුළින්, පාරිභෝගිකයා කේන්ද්‍ර කරගෙන, විශාල පාරිභෝගික පිරිසකට සම්බන්ධ වෙමින්, ගුණාත්මකභාවය ඇතුළු නිර්ණායක කිහිපයක් පිළිබඳ පාරිභෝගිකයින්ගේ විශේෂ ආකර්ෂණ සහ ධනාත්මක ආකල්ප ලබාගන්නා තනි වෙළඳනාම පිළිගැනීමට ලක්කෙරේ.

"අපේ පෝෂණීය ශක්තිජනක පානය වන මයිලෝ සඳහා Global Master Brand යන ගෞරවය හිමිවීම, අපි අගය කරනවා. පාරිභෝගිකයන්ගේ ජීවිතවල ධනාත්මක වෙනසකට, ක්‍රියාශීලී ජීවන රටාවකට හා නිසි පෝෂණයට මයිලෝ ලබාදුන් දායකත්වය නිසා ලැබුණු පාරිභෝගික විශ්වාසය හා ගෞරවය ඉන් මනාව පිළිබිඹු වෙනවා. ක්‍රියාශීලී ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ගත සිත ස්පර්ශ කිරීම පමණක් නොව, මිලියන භාගයක් තරම් ශ්‍රී ලාංකිකයින් පිරිසකටද දිනපතා පෝෂණය මෙන්ම සතුටත් ගෙනදෙන මයිලෝ සමඟ අපි එක්ව සිටින්නේ විශාල අභිමානයකින්" යනුවෙන් නෙස්ලේ ලංකා උප සභාපති - පාන වර්ග, පැවසීය.

මේ වර්ෂය තුළදී මයිලෝ ගෞරවනීය සම්මාන රැසක් දිනාගෙන ඇත. අඛණ්ඩව තෙවැනි වරටත් දිනාගත් 'වසරේ ශිෂ්‍යයින්ගේ පානය' (Student Beverage Brand of the Year) හා 2016 ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙලේදී හිමිවුණු 'වසරේ විශිෂ්ටතම කනිෂ්ඨ ක්‍රීඩා ප්‍රවර්ධක සම්මානය' (Most Outstanding Junior Sports Promoter of the Year) ඒ අතර වේ.

ලොවේ ප්‍රමුඛතම චොකලට් මෝල්ට් පානය වන මයිලෝ, ශ්‍රී ලාංකික දරුවන් පරම්පරා ගණනාවක් තිස්සේ රසවිඳි, ලාංකිකයින්ගේ ආදරය හා විශ්වාසය දිනාගත් සන්නාමයකි. සුවිශේෂී හා රසවත් චොකලට් මෝල්ට් රසය නිසා ප්‍රකට වී ඇති මයිලෝ, දේශීය නැවුම් එළකිරිවලින් නිෂ්පාදනය වී ඇති අතර විටමින් හා ඛනිජ ලවණ වලින්ද සමන්විතය. ජයග්‍රහණය කරා යන ගමනට අවැසි සහාය ලබාදෙන මයිලෝ, ක්‍රීඩාවට,

ශක්තියට හා යහපැවැත්මට ද උපකාරී වේ. දශක දෙකකට අධික කාලයක් පුරා ශ්‍රී ලංකාවේ පාසල් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් ද මයිලෝ කැපවී ක්‍රියා කර ඇත.